# 1 එදිනෙදා ජීවත් වීමේදී අවශ්‍ය වනදෑ

මෙම මාර්ගෝපදේශ අත් පොත සන්මු නගරයේ පදිංචි වී සිටින විදේශිකයන් සඳහා, සකස් කරන ලදී.
සාමාන්‍ය ජීවිතයේදී අවශ්‍ය වන කරුණු පිළිබඳව විස්තරාත්මකව මෙහි පැහැදිලි කර ඇත.
සන්මු නගරයේ සතුටින් කාලය ගත කිරීම සඳහාත්, දෛනික ජීවිතයේ අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම උදෙසාත් මෙම අත් පොත ඔබට ප්‍රයෝජනවත් වනු ඇත.

- දෛනික ජීවිතයේදී අවශ්‍යතාවයන්

## ① <u>කුණුකසළ ඉවත දමන ආකාරය</u>




ඉවතලන කුණු වර්ග කීපයක් ඇත.
ඒ් කුණු වර්ගයට අනුව, කුණු ඉවතට දැමීමේදී කුණු දමන කවර එකිනෙකට වෙනස්කමක් දක්වයි.
කුණු වර්ගය අනුව විවිධ වර්ගයේ කුණු ඉවතලන දවස් ද එකිනෙකට වෙනස් වේ.
මාර්ග දෙපස හෝ මාර්ගය මත කුණුකසළ දැමීමෙන් වලකින්න.
කරුණාකර මෙම නීතිරීති පිළිපදින්න. ( 33 වෙනි පිටුවේ සිට 58 වන පිටුව දක්වා කරුණාකර කියවන්න )

## ② උස් හඬ නගා ශබ්ද කිරීමෙන් වලකින්න



නිවසේ සිටින විට උස් හඬක් ඇසෙන ආකාරයෙන් සිංදු දැමීමෙන් වලකින්න.
ඔබගේ නිවසට ආසන්නවම පිහිටා ඇති නිවසට හාදා පැමිණෙන ආකාරයෙන් විශාල ලෙස ශබ්ද නගා කථාබහ කිරිමෙන් වලකින්න.
ඔබගේ නිවසත් අසල් වාසීන්ගේ නිවසත් ඉතා ළගින් පිහිටා තිබෙන විට, විශාල ශබ්ද සහ කථාබහකරන හඬ ඇසේ.
අසල්වාසී නිවසට ඉතා ළගින් ඔබගේ නිවස පිහිටා ඇති විට, කරුණාකර ඔවුන්ට බාධා පැමිණෙන ලෙස හැසිරිමෙන් වලකින්න.

## ③ රාත්‍රී කාලයේදී නිශබ්දව හැසිරෙන්න



සන්මු නගරය ඉතා නිස්කලංක නගරයකි.
රාත්‍රී කාලය ලබනවිට ඉක්මනින්ම නින්දට යන පුද්ගලයෝ සිටිති.
නිවසින් පිටත සිටින විටද අන්අයට කරදරයක් නොවන ආකාරයෙන් හැසිරෙන ලෙස ප්‍රවේසම් වන්න.
නිවාස ඇතුළතද කරුණාකර නිශ්‍යබ්ද ව සිටින්න.

## ④ වාහන නැවතුම්පොළේ වාහනය නවතා තබන්න



පාරේ වාහන නවත්වනවිට අහලපහල ජීවත්වන අයට බාධා පැමිණේ.
පාරේ වාහන නවත්වා තැබීම ඉතාමත්ම භයානක කාර්යයකි.කරුණාකර වාහන නැවත්වීම සඳහා වෙන්කර ඇති වාහන නැවතුම්පළේ වාහන නවතා තබන්න.

## ⑤ ප්‍රාදේශීය ගම්සභා ( *Ku / Jichikai* )

ඔබ පදිංචි වී සිටින නිවස ආසන්නයේ ප්‍රාදේශීය ගම්සභා ( *Ku / Jichikai* ) වක්ඇත.
කරුණාකර අසල්වාසීන් සමග කථාබහ කර ඔවුන් සමග අන්‍යෝන්‍ය සම්බන්ධතා පවත්වාගන්න.




## ⑥ ඔබගේ නිවසේ නාමපුවරුවක් ( *Hyosatsu* ) සකසා ගන්න.

නගර සභාවේ සිට ඔබට ඉතා වැදගත් ලිපි එවනු ලබනවා.
ලියුම් බහාලන නාම පුවරුවක් නිවසේ සකසා ගන්න.
ලියුම් බහාලන නාම පුවරුව ( *Hyosatsu* ) නිවසේ පදිංචි වී සිටින පුද්ගලයින්ගේ නම ලියා නිවසේ ඉදිරිපිට සකසා තබන්න.



◎ 1 වෙනි සහ 2 වෙනි පිටුවල අමාරු වචන ◎

※කුණුකසළ ඉවත දමන ආකාරය : කුණුකසළ ඉවත දැමීමේදී පිළිපැදියයුතු නීතිරීති බොහොමයක් ඇත.
33 පිටුවේ සිට 58 පිටුව දක්වා කරුණු කියවා බලන්න.

※ප්‍රාදේශීය ගම්සභා ( *Ku / Jichikai* ) : ප්‍රදේශවාසීන් එක්කාසු වි සුහද සාකච්චා පවත්වන ස්ථානය.

| වැඩි විස්තර දැනගැනීම සඳහා ( විමසීම් ) | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| මහජන සහසම්බන්ධතා උපකාරක අංශය ( *Shiminjichi Shienka* ) | 296 බන්චි,තොනොදයි, සන්මුනගරය ( 296,Tonodai,Sammu-Shi ) කවුළු අංක㉑ | 0475-80-0151 |

< විමසීම් කළ හැකි වේලාවන් > සදුදා සිට සිකුරාදා දක්වා උදේ වරුවේ 8.30 සිට සවස 5.00 දක්වා
※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.